1. Manatunga D. K., 1st December 2010, 10th Annual research symposium, Legends on North India 6th B.C.E to the 3rd B.C.E. University of Kelaniya, Sri Lanka

**ක්‍රි. පූ. හයවන සියවසේ සිට ක්‍රි.පූ.තුන්වන සියවස දක්වා උතුරු ඉන්දියානු රාජවංශ හා බැඳුණු පුරාවෘත්ත**

ශ්‍රී ලාංකීය මූලාශ්‍රය ඇසුරින් කළ විමර්ශනයක්

ඉතිහාසය ගොඩනැගීමේදී ඊට පදනම් වන මූලාශ්‍රය විවිධාකාර වේ.මෙහිදී සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රය , යම් යම් පුද්ගලයන් විසින් තමන් කළ පින්කම් , ප්‍රදාන ආදිය පිළිබඳව තබාගත් සටහන් , රාජ්‍ය ලේඛන , සංචාරක සටහන් ආදී සියල්ල මූලාශ්‍රය වශයෙන් සැලකේ. වංසකතා මෙයින් සාහිත්‍ය මූලාශ්‍රය යටතට ගැනේ. ශ්‍රී ලංකාවේ වංසකතාවන්ට පදනම් වූයේ බෞද්ධ ඉතිහාස සම්ප්‍රදායයි. පළමුවන ධර්ම සංගායනාවෙන් ආරම්භ වන බෞද්ධ ඉතිහාස සම්ප්‍රදාය ඉදිරියට පවත්වාගෙන ඒමේ පුරුද්ද ථෙරවාදී බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් හඳුන්වන ලද්දේ 'වංස' නැතහොත් 'වංසකතා' යනුවෙනි.වංස යන්නට ඇතුළත් වනුයේ බුදුන් වහන්සේ සහ බුද්ධ ශ්‍රාවකයන් ද මහා සම්මත ආදී රාජවංස පරම්පරාවන් ද සම්බන්ධ තොරතුරු ය. මහාවංසය ඇතුලු ශ්‍රී ලංකාවේ වංසකතා පවත්වාගෙන ඒමේ පුරුද්ද හුදෙක් ථෙරවාදී ආගමික පරමාර්ථයන්ට සීමා වූ බව පැහැදිලි වන අතර වංසකතාවල ශාසනික හා අනෙකුත් තොරතුරු ඇතුලත් වූයේ එකී ආගමික පරමාර්ථයන්ට අනුකූල වන පරිදිය. මෙහිදී වංසකතාකරුවා ද විවිධ මූලාශ්‍රය උපයෝගී කරගත් බව පෙනී යයි. පරපුරෙන් පරපුරට මුඛ පරම්පරාගතව ගෙන ආ තොරතුරු හෙවත් ජනප්‍රවාද , පුරාවෘත්ත එයින් එක් පාර්ශවයකි.

ශ්‍රී ලංකාවේ වංසකතා ලංකා ඉතිහාසය සම්බන්ධයෙන් පමණක් නොව, ඉන්දියානු ඉතිහාසය සම්බන්ධයෙන් ද වැදගත්කමකින් යුක්ත වේ.පැරණි ඉන්දියානු ඉතිහාසය ගොඩනැගීමේදී ශ්‍රී ලංකාවේ වංසකතාවන්ගෙන් ලැබුණු පිටිවහල ප්‍රමාණ කළ නොහැකි තරම් ය.

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ තෝරාගත් ශ්‍රී ලංකාවේ මූලාශ්‍රය කීපයක් ඇසුරින් එනම් දීපවංසය, මහාවංසය හා මහාවංසටීකාව ඇසුරින් ඉන්දියානු ඉතිහාසයට අදාල වන පුරාවෘත්ත කවරේද යන්න සහ ඒවායේ අන්තර්ගත වන ඓතිහාසික වැදගත්කම කවරේද යන්න විමසා බැලීමයි. මෙහිදී විශේෂයෙන් ක්‍රි. පූ. හයවන සියවසේ සිට ක්‍රි.පූ.තුන්වන සියවස පමණ දක්වා උතුරු ඉන්දියාවේ මගධ අධිරාජ්‍යය පැවති කාල වකවානුව තුළ හර්යංක , ශිශුනාග, නන්ද හා මෞර්ය රාජවංස හා සම්බන්ධ පුරාවෘත්ත කෙරෙහි අවධානය යොමු විය. ඉතිහාසයෙහි ලා වැදගත් වන එහෙත් අප්‍රකට ව විසිරී පවතින තොරතුරු ඒකරාශී කර ගැනීමත් ඒ මගින් දේශපාලන , සමාජීය හා ආර්ථික වශයෙන් වැදගත් වන තොරතුරු හඳුනාගැනීමත් මෙම අධ්‍යයනයේදී කළ හැකි විය.